# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2334/20 – 2023 මැයි මස 30 වැනි අඟහරුවාදා – 2023.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2023 අංක 84 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2020/HW/60.
ප්‍රා. ලේකම්ගේ යොමු අංකය: KDS/TUM//4/1/06/13.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2023 මැයි මස 17 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, තුම්පනේ.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පළාත බටහිර කෝරලේ, සුළු කොට්ඨාසයේ බරන්දර (322) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බරන්දර ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/TMP 2020/475 හා 2021.03.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – බෙට්වර්ත් ජනපදය – ප්‍රමාණය: හෙක්. 0.0272**

උතුරට: කේ. ජී. එස්. උයන්වත්ත හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: මාර්ගය සහ රජය හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය; බටහිරට: රජය හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය.

02. **කැබලි අක්ෂර 'බී' – බෙට්වර්ත් ජනපදය – ප්‍රමාණය: හෙක්. 0.0852**

උතුරට: කේ. ජී. එස්. උයන්වත්ත හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි බෙට්වර්ත් ජනපදය; නැගෙනහිරට: ආර්. ජී. නිශ්ශංක හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය; දකුණට: මාර්ගය; බටහිරට: කැබලි අක්ෂර ඒ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'සී' – බෙට්වර්ත් ජනපදය – ප්‍රමාණය: හෙක්. 0.0967**

උතුරට: කැබලි අක්ෂර ඩී සහ මාර්ගය; නැගෙනහිරට: ආර්. ජී. විමලරත්න හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය; දකුණට: රජය හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය; බටහිරට: කැබලි අක්ෂර ඩී.

04. **කැබලි අක්ෂර 'ඩී' – බෙට්වර්ත් ජනපදය – ප්‍රමාණය: හෙක්. 0.0658**

උතුරට: රජය හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය සහ මාර්ගය; නැගෙනහිරට: කැබලි අක්ෂර සී; දකුණට: රජය හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය; බටහිරට: රජය හිමිකම් කියන බෙට්වර්ත් ජනපදය සහ මාර්ගය.

EOG 05 - 0262

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.